# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No. PFD/RED/REG/CIR/2023/04

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024.05.29

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 02/2024

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන් හා
රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ සහ 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020හි විධිවිධාන සංශෝධනය කිරීම - මු.රෙ. 104 සහ මු.රෙ. 108**

**01. පසුබිම**

01. (i) නිලධාරින්ගේ/සේවකයන්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වැරදි හෝ වංචා නිසා රජයට පාඩු සිදුව ඇති අවස්ථාවල දී මුදල් රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය අනුගමනය කර එම පාඩු සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බවට වගබලාගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම ගණන්දීමේ නිලධාරින්ගේ යුතුකම වන අතර ගණන්දීමේ නිලධාරින් මේ ආකාරයෙන් කටයුතු කරන බවට වගබලාගැනීම පිණිස විධිවිධාන සැලැස්වීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ.

01. (ii) කෙසේ වුව ද, රජයේ නිලධාරින්ගේ අතපසුවීම්, නොසැලකිල්ල, ප්‍රමාදය, වැරදි ගිණුම් කටයුතු හේතුවෙන් රජයේ ආයතනවල සිදු වී ඇති නැතිවීම්, හානිවීම්, අක්‍රමික ගෙවීම් ආදිය නිසා උද්ගත වී ඇති පාඩු සම්බන්ධව නිසි පරිදි කටයුතු නොකිරීම පිළිබඳව පසුගිය කාල සීමාව තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අවධානයට ලක්වී ඇත.

01. (iii) එබැවින්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් හා ගණන්දීමේ නිලධාරින් විසින් ඉහත (01) (i) හි සඳහන් පරිදි කටයුතු කළ යුතු බව අවධාරණය කරමින්, 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 104හි විධිවිධාන හා 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2020 හි I කොටස මගින් සංශෝධිත 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 108හි පවත්නා විධිවිධාන පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරෙන අතර මෙම සංශෝධනය 2024.06.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වේ.

02. මු.රෙ. 104 (1) හා (2) වෙනුවට පහත සඳහන් සංශෝධිත රෙගුලාසි ආදේශ කෙරේ.

"මු.රෙ. 104 - නැතිවීම් පරීක්ෂණය, නැතිවීම/පාඩුවීම වාර්තා කිරීම සහ ඊට වගකිව යුත්තන් නිශ්චය කිරීම

104 (1) (අ) - පාඩුවක් හෝ අලාභහානියක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු ය.

(ආ) රු. 2,000,000/-හා ඊට වැඩියෙන් තක්සේරු කරන ලද පාඩුවක් හෝ අලාභහානියක් හෝ සම්බන්ධයෙන් වූ කල්හි, නියමිත ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත්කරනු ලබන තුරු ප්‍රාරම්භක පරීක්ෂණ වහාම ආරම්භ කළ යුතු ය. පරීක්ෂණ මණ්ඩලයේ සභාපති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/ 2016 හි සඳහන් අර්ථනිරූපණය පරිදි ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරියෙකු විය යුතු ය. රු. 2,000,000/- ට අඩු අගයකට තක්සේරු කරන ලද පාඩුවක් හෝ අලාභහානියක් හෝ සම්බන්ධයෙන් වූ කල්හි, ගණන්දීමේ නිලධාරියා විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත්කරනු ලැබිය යුතු අතර එම අගය රු. 1,000,000/- හා රු. 2,000,000/- අතර වේ නම් එම පත්කිරීමේ ලිපියේ පිටපතක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත දැනගැනීම සඳහා යොමු කළ යුතු ය.

104 (2) - නැතිවීම/පාඩුවීම වටිනාකම (මු.රෙ. 105(1) ප්‍රකාර) රු. 750,000/- ට වැඩිනම් ඒ වාර්තාවේ පිටපතක් මහා භාණ්ඩාගාරයට (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට) එවිය යුතු ය. වංචාවක් නොසැලකිල්ලක් හෝ වෙනත් වරදක් සිදුවී නැත්නම් හෝ සම්බන්ධ නොවන්නේ නම් පහත සඳහන් නැතිවීම්/පාඩුවීම් මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම අවශ්‍ය නොවේ.

(අ) රු. 25,000/- නොඉක්මවන සහ පොතෙන් කපාහැරීමක් සම්බන්ධ නොවන්නා වූ බඩු බාහිරාදිය නැතිවීම

(ආ) අලාභය සම්පූර්ණයෙන් ම අයකර ගන්නා ලද්දේ නම් රු. 25,000/-ට වැඩි නොවූ අලාභහානි (වවුචර පඩි ලැයිස්තු, ගමන් වියදම් ඉල්ලුම්පත්‍ර යනාදිය මත කරන ලද අධි ගෙවීම් හෝ සාවද්‍ය ගෙවීම් හෝ හේතුකොට ගෙන සිදු වූ පාඩු වීම් මීට ඇතුළත් වන නමුත් මෙහි පහත (ඇ) වගන්තියේ සඳහන් ඌනතාවන් ඊට ඇතුළත් නොවේ.)

පූර්වෝක්ත උප වගන්තියේ සඳහන් යම්කිසි අලාභහානියක් සම්පූර්ණයෙන්ම හෝ අප්‍රමාදව අයකර ගැනීමට අපොහොසත් වුවහොත් ඒ අලාභහානිය හා/හෝ අයකර නොගැනීම ගැන වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල් ප්‍රමාණය අධිභාරයක් ලෙස අයකර ගත යුතු ය.

(ඇ) මෙහි පහත සඳහන් සීමාවන් ඇතුළතට වැටෙන මුදල්, ප්‍රවේශපත්‍ර, මුද්දර ආදිය පිළිබඳ ඌනතාවන් ඊට වගකිවයුතු නිලධාරියා නොහොත් නිලධාරීන් විසින් වහාම පූර්ණය කරනු ලැබුවහොත්

| | | |
|---|---|---|
| (i) | මුදල්, ප්‍රවේශපත්‍ර, මුද්දර ආදිය පිළිබඳව දිනපතා හරි වැරදි බැලීමක් කෙරෙන ආයතනයන්හි | වටිනාකම රු.25,000/- නොඉක්මවන ඌණතාවක් |
| (ii) | දිනපතා හරි වැරදි බැලීමක් නොකෙරෙන අවස්ථාවල දී | වටිනාකම රු.15,000/- නොඉක්මවන ඌණතාවක් |

පූර්වෝක්ත ව්‍යාතිරේක අදාළ වන්නේ මුදල් කටයුතු සම්බන්ධයෙන් පමණි. අවශ්‍ය අවස්ථාවන්හි විනයානුකූල ක්‍රියාමාර්ග නොගතයුතු බවක් මෙයින් අදහස් නොකෙරේ.”

**03.** රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2020 හි I කොටස - 2 ඡේදය මගින් සංශෝධිත 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 108හි විධිවිධාන පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

**“මු.රෙ. 108 - හානි සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු බලධරයෝ**

මු.රෙ. 108 (1) යම්කිසි නව ප්‍රතිපත්තියක් සම්බන්ධවී නැති කල්හි මෙහි පහත සඳහන් අවස්ථාවලදී හානි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට පහත වගුවේ සඳහන් නිලධාරීන්ට බලය දෙනු ලැබේ.

| හානි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය ලත් නිලධාරියා | හානිය පිළිබඳ විස්තර | මූල්‍ය සීමාව |
|---|---|---|
| (අ) අමාත්‍යාංශ ලේකම්වරයෙකු වන ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා | (අ) සාමාන්‍ය අපතය (සාමාන්‍ය වියලීම් හා හැකිලීම්, වාෂ්ප වීම හා නරක් වීම් යනාදිය) | භාණ්ඩාගාරය විසින් නියම කරනු ලැබූ ප්‍රතිශතයන් ඇතුළත (අදාළ ප්‍රතිශත ඉදිරියේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.) |
| | (ආ) මුහුදේ දී හෝ ගුවනේ දී සිදුවන හානි | දැනට පවත්නා රු. 5,000,000/- සීමාව රු. 7,000,000/- ලෙස සංශෝධනය කෙරේ. |
| | (ඇ) වෙළෙඳුන්, නැව්ගත කරන්නන්, නැව් සමාගම් නියෝජිතයන් හෝ බඩු ගොඩබාන සමාගම් යන මේවායේ කොන්ත්‍රාත්තු ගිවිසුම් පැහැර හැරීම තුළින් ඇති වන හානි | |
| | (ඈ) මෙහි පහත සඳහන් වෙනත් හානි<br>(i) මු.රෙ. 105 (1) ප්‍රකාර | දැනට පවත්නා රු. 2,000,000/- සීමාව රු.3,000,000/- ලෙස සංශෝධනය කෙරේ. |
| | (ii) වංචාවක් හෝ පවතින ක්‍රමයේ දෝෂයක් හෝ නොමැති කල්හි | දැනට පවත්නා රු. 5,000,000/- සීමාව රු. 7,000,000/- ලෙස සංශෝධනය කෙරේ. |
| (ආ) අමාත්‍යාංශ ලේකම්වරයෙකු නොවන ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා | ඉහත 108 (1) (අ) හි අමාත්‍යාංශ ලේකම්වරයෙකු වන ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ සීමාවම ආදේශ කෙරේ. | |
| (ඇ) ගණන්දීමේ නිලධාරියා | (අ) 104 (2), 104 (2) (අ), (ආ) හා (ඇ) යටතේ වාර්තා කිරීම අවශ්‍ය නොවන හානි සම්බන්ධයෙන් කටයුතු කළ හැකි ය. | |
| | (i) මු.රෙ. 104 (2) ප්‍රකාර | දැනට පවත්නා රු. 50.000/- සිමාව රු 750,000/-. ලෙස සංශෝධනය කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | (ii) | මු.රෙ. 104 (2) (අ) ප්‍රකාර | දැනට පවත්නා රු. 500/- සීමාව රු. 25,000/- ලෙස සංශෝධනය කෙරේ |
| | (iii) | මු.රෙ. 104 (2) (ආ) ප්‍රකාර | දැනට පවත්නා රු. 500/- සීමාව රු. 25,000/- ලෙස සංශෝධනය කෙරේ |
| | (iv) | මු.රෙ. 104 (2) (ඇ) ප්‍රකාර | |
| | | (i) මුදල්, ප්‍රවේශපත්‍ර, මුද්දර ආදිය පිළිබඳව දිනපතා හරි වැරදි බැලීමක් කෙරෙන අවස්ථාවල දී | දැනට පවත්නා රු. 250/- සීමාව රු. 25,000/- ලෙස සංශෝධනය කෙරේ |
| | | (ii) දිනපතා හරි වැරදි බැලීමක් නොකෙරෙන අවස්ථාවල දී | දැනට පවත්නා රු. 25/- සීමාව රු. 15,000/- ලෙස සංශෝධනය කෙරේ |
| | (ආ) | මු.රෙ. 105 (1) ප්‍රකාර | දැනට පවත්නා රු. 250,000/- සීමාව රු. 500,000/- ලෙස සංශෝධනය කෙරේ. |

(2) ඉහත මු.රෙ. 108 (1) යටතේ අලාභහානි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අධිකාර බලයට,

(i) හානි වූ මුදල අධිභාරයක් වශයෙන් නිලධාරින්ගෙන් අයකිරීම.

(ii) ඇප, රක්ෂණ යනාදී මගින් ආපසු අයකර ගැනීමට බලය දීම,

(iii) මු. රෙ. 109 (1) යටතේ පොතෙන් අස්කිරීමේ අවසාන නියෝගය දීම හා

(iv) මු. රෙ. 109 යටතේ අත්හැර දැමීමට අවසර දීමේ බලය

ඇතුළත් වේ.

(3) හානි සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියකුට මු.රෙ. 108 (1) හි සීමාවන් යටතේ අධිකාර බලය නොමැති අවස්ථාවක දී පමණක්, සුදුසු නියෝග නිකුත් කිරීම සඳහා, අදාළ කාරණය පිළිබඳ සම්පූර්ණ විස්තර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා/ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ සහිතව මහා භාණ්ඩාගාරය (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) වෙත වාර්තා කළ යුතු වේ. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් එම ඉල්ලීම් සම්බන්ධව භාණ්ඩාගාරයේ ලේකම්වරයාගෙන් හෝ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගෙන් සුදුසු නියෝග ලබා ගැනීමට කටයුතු කරනු ඇත. තව ද, හානි සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට අධිකාර බලය ඇති සීමාව ඇතුළත කටයුතු කිරීමෙන් තොරව යොමු කරනු ලබන ඉල්ලීම් මහා භාණ්ඩාගාරය විසින් සලකා බලනු නොලැබේ.

(4) මු.රෙ. 104 (3), 104 (4) යටතේ නැතිවීම් හා අලාභහානි වාර්තා කිරීම හා/හෝ මු.රෙ. 109 යටතේ ගිණුම් පොත්වලින් අගය කපා හැරීමට අනුමැතිය ලබාගැනීම සඳහා පොදු 283, 284 හා 285 ආකෘති පත්‍ර භාවිතා කළ යුතු ය. අවස්ථානුකූලව මෙම ආකෘති පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කර අදාළ පරිදි මහා භාණ්ඩාගාරය (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) හා/හෝ හානි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ඉහත මු.රෙ. 108 (1) යටතේ බලය ලත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) ඉහත මු.රෙ. 108 (1) වගුව යටතේ නියම කර තිබෙන මූල්‍ය සීමාවන් ප්‍රතිශෝධනය කිරීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයාට බලය ඇත්තේ ය."

04. පොදු උපදෙස්

04. (i) හානියක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් මු.රෙ. 104 යටතේ පරීක්ෂණ පවත්වා මු.රෙ. 104 (3) හා 104 (4) යටතේ සඳහන් ප්‍රාරම්භක වාර්තාව හා පූර්ණ වාර්තාව එකී මුදල් රෙගුලාසිවල දක්වා ඇති කාල සීමාව තුළදී සකස් කර නිම කිරීමට කටයුතු යෙදීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ/ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වන අතර යම් නොවැලැක්විය හැකි හේතුවක් මත (උදා: හානියට පත් දේපල නඩු කටයුත්තක විෂයයක් වන විට හානියේ වටිනාකම තක්සේරු කළ නොහැකි අවස්ථා) පරීක්ෂණ කටයුතු පමා වේ නම් හෝ පමා කිරීමට සිදුවේ නම් ඒ සම්බන්ධව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා දැනුවත් කර ඒ සඳහා විධිමත් අනුමැතිය ලබාගැනීමට ගණන්දීමේ නිලධාරියා/ පරීක්ෂණ මණ්ඩලය කටයුතු කළ යුතු ය.

04. (ii) තව ද, කපා හැරීම හා අත්හැර දැමීම සම්බන්ධයෙන් වන පරීක්ෂණ වලදී හෝ වෙනත් එවැනි කාරණයකදී හෝ නීතිමය හෝ පරිපාලනමය වශයෙන් ක්‍රියාමාර්ග ගැනීමකදී මෙම චක්‍රලේඛයේ විධිවිධාන යටතේ කටයුතු කර තිබීම බාධාවක් ලෙස නොසැලකිය යුතු ය.

04.(iii) ගිණුම්කරණ දෝෂ හේතුවෙන් පාඩුවීමක්/නැතිවීමක්/හිඟ ආදායමක් ලෙස ගිණුම්වල පෙන්නුම් කරන වටිනාකම් අදාළ ගිණුම් නිවැරදි කරගැනීම මගින් ගිණුම්වලින් ඉවත්කරගත යුතු ය.

04. (iv) මේ වන විට කටයුතු කර නොමැති හානි හා පාඩු සම්බන්ධ සියලු කටයුතු **2024.12.31** දිනට ප්‍රථම අවසන් කිරීමට පියවර ගත යුතු ය. ඒ අනුව, ඉදිරියේ දී ඉහත 04 (i) යටතේ සළකා බැලිය හැකි හානි හා පාඩු හැර වර්ෂ දෙකකට වඩා පැරණි හානි හා පාඩු කපාහැරීම සඳහා වන ඉල්ලීම් මහා භාණ්ඩාගාරයට යොමු නොකිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වගබලා ගත යුතු වේ.

**05.** රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සහ රජයට අයත් සමාගම් යනාදී ආයතනවල අලාභහානි සම්බන්ධයෙන් වන විට එම ආයතන විසින් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති **යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශය, මෙහෙයුම් අත්පොත හා ඊට අදාළව නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.**

**ඒ.කේ. සෙනෙවිරත්න**
භාණ්ඩාගාරයේ ලේකම් (වැ.බ.)

පිටපත්:
01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති